# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2405/32 - 2024 ඔක්තෝබර් මස 10 වැනි බ්‍රහස්පතින්දා - 2024.10.10

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

### බස්නාහිර පළාතේ පළාත් සභාව

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 ඊ ව්‍යවස්ථාව සමග කියවිය යුතු 154 ඇ ව්‍යවස්ථාව යටතේ හා 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 19 (5) වගන්තිය යටතේ සාදන රීති

බස්නාහිර පළාතේ ආණ්ඩුකාරවර හනිෆ් යූසුෆ් වන මා, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 ඊ ව්‍යවස්ථාව සමග කියවිය යුතු 154 ඇ ව්‍යවස්ථාව යටතේ හා 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 19 (5) උපවගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව සාදන ලද, "2024 අංක 2 දරන බස්නාහිර පළාත් සභා අරමුදලට අදාළ ප්‍රසම්පාදන කටයුතු පිළිබඳ (සංශෝධිත) රීති" මෙයින් ප්‍රකාශයට පත් කරනු ලබන බව නිවේදනය කරමි.

**හනිෆ් යූසුෆ්,**
ආණ්ඩුකාරවර,
බස්නාහිර පළාත.

වර්ෂ 2024 ක් වූ ඔක්තෝබර් මස 09 වැනි දින,
බත්තරමුල්ල,
බස්නාහිර පළාත් සභා ගොඩනැගිල්ලේ පිහිටි,
බස්නාහිර පළාත් ආණ්ඩුකාරවර කාර්යාලයේ දී ය.

1A - PG 6901 — 07 (2024/10)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**රීති**

01. මෙම රීති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 2394/70 හා 2024 ජූලි මස 26 වැනි දිනැති *අති විශෙෂ ගැසට් පත්‍රයට* ඇතුළත් 2024 අංක 1 දරන බස්නාහිර පළාත් සභා අරමුදලට අදාළ ප්‍රසම්පාදන කටයුතු පිළිබඳ සංශෝධිත රීතින්ගෙන් සංශෝධිත ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 2186/25 හා 2020 ජූලි මස 30 වැනි දිනැති *අති විශෙෂ ගැසට් පත්‍රයෙහි* ඇතුළත් බස්නාහිර පළාත් සභා අරමුදලට අදාළ ප්‍රසම්පාදන කටයුතු පිළිබඳ රීති සංශෝධනය කිරීම පිණිස පනවනු ලබයි.

02. මෙම රීති බස්නාහිර පළාත් අරමුදලට අදාළ 2024 අංක 2 දරන බස්නාහිර පළාත් සභා අරමුදලට අදාළ ප්‍රසම්පාදන කටයුතු පිළිබඳ (සංශෝධිත) රීති යනුවෙන් හැඳින්වේ.

03. මෙම රීති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 2394/70 හා 2024 ජූලි මස 26 වැනි දිනැති *අති විශෙෂ ගැසට් පත්‍රයට* ඇතුළත් 2024 අංක 1 දරන බස්නාහිර පළාත් සභා අරමුදලට අදාළ ප්‍රසම්පාදන කටයුතු පිළිබඳ (සංශෝධිත) රීතින්ගෙන් සංශෝධිත ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 2186/25 හා 2020 ජූලි මස 30 වැනි දිනැති *අති විශෙෂ ගැසට් පත්‍රය* යටතේ නිවේදනය කරන්නට යෙදී ඇති බස්නාහිර පළාත් සභා අරමුදලට අදාළ ප්‍රසම්පාදන කටයුතු පිළිබඳ රීති 7 වන වගන්තියේ පළමු වන උප වගන්තිය යටතේ සඳහන් "මිලියන පනහ" යන වචනය ඉවත් කර "මිලියන පහළොව" යන වචන ඇතුළත් කරමින් මෙයින් සංශෝධනය කරනු ලබයි.

04. මෙම රීති යටතේ සිංහල, ඉංග්‍රීසි සහ දෙමළ පාඨ අතර අනනුකූලතාවයක් හට ගතහොත් එවිට සිංහල පාඨය ප්‍රමුඛ වෙයි.

EOG 10 - 0116

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.